**බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**
**මධ්‍යම සංස්කෘතික අරමුදල**

# පුරප්පාඩු දැන්වීමයි

බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති මධ්‍යම සංස්කෘතික අරමුදලේ පුරප්පාඩු වී ඇති පහත තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් වෘත්තිකයින් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සහකාර අධ්‍යක්ෂ (නීති) (පුරප්පාඩු සංඛ්‍යාව 01)**

| | |
|---|---|
| **වැටුප් පරිමාණය** | MM 1-2 (රු. 54,550 - 10x1,375 - 15x1,910 - 96,950)<br>(ක.සේ.චක්‍රලේඛ අංක 2/2016) |
| **වයස් සීමාව** | වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.<br>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. |

## අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීති උපාධියක් ලබා තිබීම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු ලෙස දිවුරුම් දී තිබීම.

සහ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු ලෙස දිවුරුම් දීමෙන් පසුව නීතිඥ වෘත්තියේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

විවෘත තරග විභාගයක් හා / හෝ පත්වීම් බලධරයා විසින් පත්කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පත්වීමේ ස්වභාවය**

සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායකත්වය සඳහා හිමිකම් සහිත

## පොදු සුදුසුකම්

සෑම අපේක්ෂකයෙක්ම,

(අ). ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ආ). තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ඇ). විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

## වෙනත්

රජයේ, රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් සමග තනතුරට තෝරා ගතහොත් නිත්‍ය තනතුරින් නිදහස් කරන බවට තම ආයතන ප්‍රධානීන්ගේ එකඟතාව ඇතුළත් ලිපියක් ද සහිතව ඉදිරිපත් කළ යුතුය. (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.)

අයදුම්පත සමග අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතිකවල ඡායා පිටපත් යොමු කිරීමට අයදුම්කරුවන් විසින් වග බලා ගත යුතුය. ඉහත ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවාගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවක දී ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

මේ සඳහා ඉදිරිපත් වීමට අභිලාෂය පළකරන අයදුම්කරුවන් **https://www.cultural.gov.lk**, **https://mbs.gov.lk**, **www.heritage.gov.lk** හා **www.ccf.gov.lk/notices** වෙබ් අඩවි මගින් ද මධ්‍යම සංස්කෘතික අරමුදල, 212/1, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 පිහිටි ප්‍රධාන කාර්යාලයේ විමසීම් කවුළුව මගින් ද ලබාගත හැකිය. මෙම ආකාරයන්ගෙන් ලබාගන්නා අයදුම්පත් සම්පූර්ණ කර තමාගේ සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පිටපත් ද සමග **2024.12.31** දිනට පෙර ලැබෙන ලෙසට **"අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම සංස්කෘතික අරමුදල, 212/1, බෞද්ධාලෝක මාවත, කොළඹ 07"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් පමණක් එවිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කරන **ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සහකාර අධ්‍යක්ෂ (නීති) ලෙස නිවැරදිව සඳහන් කළ යුතුය.**

**අධ්‍යක්ෂ ජනරාල්,**
**මධ්‍යම සංස්කෘතික අරමුදල,**
**212/1, බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07.**

SELACINE